# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන)

**(117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා විසින් 2013 මාර්තු මස 08 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2013 පෙබරවාරි මස 26 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

[229 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 6.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය* : මේ වගන්තිය මගින් (117 වන අධිකාරය වූ (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 13 වන වගන්තියේ සඳහන් ගාස්තු නියම කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම මගින් එම වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*3 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ගාස්තු නියම කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*4 වන වගන්තිය* : මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තියේ සඳහන් ගාස්තු නියෝග මගින් නියම කිරීම සඳහා අවස්ථාව ලබා දෙමින් එකී වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*5 වන වගන්තිය* : මේ වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා දක්වා ඇති ගාස්තු සංශෝධනය කිරීම මගින් එම උපලේඛනය සංශෝධනය කරනු ලැබේ.

එල්. ඩී.— ඕ. 18/2013

## (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

**1.** මේ පනත 2013 අංක    දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2013 ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන ලෙස සලකනු ලැබිය යුතු ය.

(117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2.** (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥා පනතේ 13 වන වගන්තියේ (6) වන උපවගන්තියේ ''රුපියල් පහක ගාස්තුවක්'' යන වචන වෙනුවට ''රුපියල් පහක ගාස්තුවක් හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් මුදලක්'' යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 22 වන වගන්තියේ (2) වන උපවගන්තියේ ''රුපියල් පහක ලියාපදිංචි කිරීමේ ගාස්තුවක්'' යන වචන වෙනුවට ''රුපියල් පහක ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් හෝ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන වෙනත් යම් මුදලක්'' යන වචන ආදේශ කිරීමෙන්. එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ.

''ගාස්තු

48. කලින් කල අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන පළමුවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තු ඒවා අදාළවන කාරණා සම්බන්ධයෙන් ගෙවනු ලැබිය යුතු ය.''.

ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම උපලේඛනයේ I වන කොටසේ—

(i) එහි 6 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:—

"(6) පූර්වාවධාන දැන්වීමක විස්තර කර ඇති එක් එක් ඉඩම සඳහා, එක් එක් ඉඩම සඳහා වූ එක් එක් පූර්වාවධාන දැන්වීම ලියාපදිංචි කරන එක් එක් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයකට වසර දෙකක කාලයක් සඳහා ගාස්තුව රු. 2500.00";

(ii) එහි 9 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:—

"(9) ප්‍රකාශිතවම නිදහස් කරනු නොලැබූ කවර හෝ අන්දමේ වූ නීත්‍යානුකූල සාධන පත්‍රයකට වුවද ගාස්තුව රු.100.00";

(iii) එහි 10 වන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:—

"(10) 29 වන වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන සාධන පත්‍රයක් සඳහා ගෙවිය යුතු අනෙකුත් ගාස්තුවලට අතිරේකව ගාස්තුව රු.1000.00";

(2) එම උපලේඛනයේ III වන කොටස වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:—

"III වන කොටස

(1) යවන ලද හෝ භාර දෙන ලද ඔප්පුවල

| | |
|---|---|
| සාධන පත්‍රවල හෝ ලේඛනවල දෙවන පිටපත් නැතහොත් ඒවායේ සාක්ෂි දැරූ පිටපත් හෝ සහතික කරන ලද පිටපත් පරීක්ෂා කිරීම සඳහා හෝ II, III, IV, V, සහ VI යන පරිච්ඡේද යටතේ යම් පොතක් හෝ සූචියක් පරීක්ෂා කිරීමට පරීක්ෂා කරනු ලබන එක් එක් ගණුදෙනුව හෝ කාරණය සඳහා ගාස්තුව | රු.500.00 |
| (2) (අ) යම් ඉඩමකට අදාළ යම් ඔප්පුවක පිටපත් හෝ උධෘත ලබාගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් සඳහා ගාස්තුව | රු.500.00 |
| (ආ) යම් ඉඩමකට අදාළව යම් පත්ඉරුවක් හෝ පත්ඉරුවල පිටපත් හෝ උධෘත ලබා ගැනීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් සඳහා ගාස්තුව | රු.100.00 |

(3) 43 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ පූර්වාධානයක් ලියාපදිංචි කිරීම හැර, අවිනිශ්චිත නඩුවක්, පූර්වතා දැන්වීමක්, තහනම් පූර්වතා දැන්වීමක් ලියාපදිංචි කිරීම පිළිබඳ සටහනක් සැපයීමට ගාස්තුව, එබන්දක් ලියාපදිංචි කිරීමේ දී ගෙවනු ලැබූ ගාස්තුවම ගෙවිය යුතු ය.”

වලංගු භාවය සහ හානිපූරණය.

**6.** 2013 ජනවාරි මස 1 වන දින සිට ආරම්භව 2013 මාර්තු මස 31 වන දිනයෙන් අවසන්වන කාලය දක්වා අයකිරීම සඳහා හෝ එකතු කිරීම සඳහා මේ පනත මගින් බලය දී ඇති යම් කාර්යයක් සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඔහුවෙනුවෙන් නැතහොත් මේ පනත යටතේ බලය පවරන යම් තැනැත්තකු විසින් අයකරනු ලබන හෝ එකතු කරනු ලබන යම් ගාස්තු රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ මේ පනත යටතේ බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු විසින් වලංගු ලෙස අය කරනු ලැබ හෝ එකතු කර ඇති ලෙස සලකනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, මේ වගන්තියේ ඉහත කී විධිවිධාන, ඉහත කී කාලසීමාව තුළ දී අයකරනු ලබන හෝ එකතු කරනු ලබන ගාස්තු සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් කරනු ලබන තීරණයකට හෝ නියෝගයකට නැතිනම් යම් අධිකරණයක විභාග වෙමින් පවත්නා නඩු කටයුතු සඳහා බල නොපෑ යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**7.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.